**අම්බලන්ගොඩ නගර සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්බලන්ගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.12,828,340 ක වටිනාකම හා භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ගබඩා ලෙජරයේ සටහන් නොවූ අයිතම 04 කට අදාළ තොග ඒකක 38 ක තක්සේරු වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව අවසාන ශුද්ධ වත්කම් වටිනාකම රු.182,632,104 ක් වූ අතර, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය අනුව රු.181,312,401 ක් වූයෙන් රු.1,319,703 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී එම අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීමේ වටිනාකම රු.67,180 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කිරීමේ දී එම අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | - එම - |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.4,475,193 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,277,670 ක් වූ ගිණුම් විෂයයන් 16 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිසි උපලේඛන ලබා දීමට කටයුතු කරන බව. | ශේෂ සනාථන සහ නිවැරදි උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත 170(2) වගන්තිය | බදු මුදල් අයකර ගැනීමට සභාවට දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම් ප්‍රමාණවත් නොවන බැවින් නිලධාරියෙකු බඳවා ගැනීම දුෂ්කර වී ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | සභාව විසින් 2017 වර්ෂය හා ඊට පෙර ලබාගත් රු.290,564 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | අත්තිකාරම් ශේෂ පිළිබඳ තොරතුරු සොයා ගත නොහැකි බව සහ පොත් තැබීමේ දෝෂයක් පැවති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | 2014 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු වාහන 02ක් සහ හාඩිමෙක් යන්ත්‍රයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අපහරණ කටයුතු නිම කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කඩිනමින් අපහරණ කටයුතු සිදුකළ යුතුය. |
| (ඈ) | 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක /2010/01 හි 5 වන වගන්තිය | සෑම කඩකාමර ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවද, සභාව ඊට පටහැනිව කඩ කාමර 46 ක් සඳහා වර්ෂ 10 කට අදාළව ගිවිසුම්ගත වී තිබුණි. | වර්තමාන කඩ කාමර බදු ගිවිසුම් සියල්ල වසර 03 න් 03 ට යාවත්කාලීන කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7.2 අධිකාරි බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ලේකම් විසින් දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් ගමන් කිරීම සඳහා ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර ඉන්ධන වෙනුවෙන් රු.973,464 ක් ගෙවීම් කර තිබුණි. | සභාපතිවරයා වෙත සතු කරනු ලබන සියළු බලතල ලේකම්ට තිබිය යුතු බව. | පිරිවැය අවම වන පරිදි වාහන භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 23,564,792 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 19,158,420 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 27,775,000 | 23,412,643 | 25,597,905 | 33,037,261 | 24,050,000 | 23,950,355 | 24,696,404 | 35,222,523 |
| කුලී | 26,338,750 | 19,879,535 | 18,712,568 | 13,120,697 | 23,601,250 | 17,835,503 | 18,140,843 | 11,953,730 |
| බලපත්‍ර ගාස්තු | 603,000 | 535,693 | 723,703 | 37,899 | 604,000 | 375,494 | 431,844 | 225,909 |
| වෙනත් ආදායම් | 30,089,000 | 19,946,983 | 21,018,308 | 2,312,782 | 22,995,000 | 21,229,464 | 20,205,294 | 3,384,107 |
| එකතුව | 84,805,750 | 63,774,854 | 66,052,484 | 48,508,639 | 71,250,250 | 63,390,816 | 63,474,385 | 50,786,269 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු හා කුලී ආදායම් ශේෂය පිළිවෙලින් රු.35,222,523 ක් හා රු.11,953,730 ක් වූ අතර, අවසානයට එය රු.33,037,261 ක් හා රු.13,120,697 ක් විය. | හිඟ කුලී ශේෂ කපා හැරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | භාවිතා කළ නොහැකි තත්ත්වයක පැවති පැරණි වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 58 ක් සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කඩිනමින් ඉදිරි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | සභාව සතු දේපල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය වන විට ගිවිසුම් කල් ඉකුත් වූ කඩ කාමර 51 ක් පැවති අතර, එම ගිවිසුම් යාවත්කාලීන කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. තවද කඩ කාමර 79 කට අදාළව ගිවිසුම් ගත කාලපරිච්ඡේදය සඳහන් කිරීමකින් තොරව කඩ කාමර බදු දී තිබුණි. | බදු ගිවිසුම් අළුත් කිරීම සඳහා බදුකරුවන් වෙත ලිපි යොමු කළ බව සහ වර්තමාන බදු ගිවිසුම් වසර 03 න් 03 ට යාවත්කාලීන කළයුතු බවට ගිවිසුමේ සඳහන් කළ බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) | සභාව සතු කඩ කාමර 2007 හා 2015 වර්ෂවලින් පසුව පිළිවෙලින් 55 ක් හා 51 ක් තක්සේරු කර බදු අයකර නොතිබුණි. | විගණන නිරීක්ෂනය හා එකඟ වන බව | චක්‍රලේඛ ප්‍රකාරව තක්සේරුව සිදු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.55,104 ක් හා මුද්දර ගාස්තු රු.39,229,742 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ට්‍රැක්ටර් 02 ක්,ටිපර් රථයක් සහ අත් ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කිරීම සඳහා සභාව සතු වාහන අළුත්වැඩියා අංගනයට යොමුකර වර්ෂ 08 ත් මාස 04 ක කාල පරාසයක් ගත වී තිබුණ ද අළුත්වැඩියාවන් කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අබලන් තත්ත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් ඉංජිනේරු වාර්තා ලද විගස ඉදිරි කටයුතු සිදු කරන බව. | සභාව සතු වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම සඳහා නියමිත කාල වකවානු තුළ අළුත්වැඩියා කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 18 දරන නගර සභා ආඥා පනතේ 159(1) වන වගන්තියේ විධිවිධාන වලට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේ සභාවට ලැබිය යුතු රු.786,979 ක මුද්දර ගාස්තු අයකර ගැනීම වෙනුවෙන් සභාවේ ලේකම් ඇතුළු නිලධාරීන් 05 දෙනෙකු සඳහා දිරි දීමනා වශයෙන් සභා අරමුදලින් රු.23,609 ක් ගෙවීම් කර තිබුණි. | සභා තීරණය පරිදි ලැබුණු මුදලින් සියයට 3 ක මුදල් දීමනාව නිලධාරීන් වෙත ගෙවීම් කරන ලද බව. | පනත අනුව කටයුතු කළ යුතු අතර අනුකූල නොවන ගෙවීම් නැවත අයකළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවට අයත් තානායම් භූමිය සංවර්ධනය කර පවත්වාගෙන යාම සඳහා 2013.11.09 දින සිට වසර 50 ක කාලසීමාවක් සඳහා පෞද්ගලික සමාගමක් සමඟ බදු ගිවිසුමට එළඹ තිබූ අතර බදු දී වසර 10 ක කාලසීමාවක් ගත වී තිබුණ ද, මෙම භූමිය තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර, නිෂ්ක්‍රීයව පැවතුණි. | ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරී වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව. | තානායම් භූමිය සංවර්ධන කටයුතු සඳහා යොදා ගත යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පටබැඳිමුල්ල ආදාහනාගාරය අසල බෝක්කුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම හේතුවෙන් රු.157,148 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | මිල විශ්ලේෂණය හා වැඩ විස්තරයේ සම්පූර්ණ පිරිවිතරය පිළිබඳ විස්තර සභාව වෙත ලබා දී නොමැති බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර, සේවය හැර ගිය සහ වැඩ තහනමට ලක් වූ ස්ථිර නොවන සේවකයන් 63 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.487,043 ක ණය ශේෂයක් පැවතුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |